# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

**විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை**

17 MAR 2025

| | | | |
|---|---|---|---|
| විමසීම අංකය / விசாரணை இலக்கம் / Query No | SGLG/KG/AWPS/2024/AQ/16(I) | නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue | 2025 මාර්තු 14 දින |

Addressed to: ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී, ප්‍රාදේශීය සභාව, වරකාපොල. වෙතටයි அவர்களுக்கு

විෂයය / விடயம் / Subject: මූල්‍ය හා කාර්ය සාධන විගණනය - 2024 වර්ෂය

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
This is only a query calling for information for clarification and not an audit report.
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**

ඔබ විසින් නිරතුරුවම විගණනය වෙනුවෙන් දක්වනු ලබන දායකත්වය අගය කරන අතර, වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයට අදාලව කරන ලද විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් කරුණු සනාථ කර ගැනීම සඳහා ඔබගේ කාරුණික දායකත්වය අපේක්ෂා කරමි.

02. සෞඛ්‍ය උපකරණ තොග ලේඛනය

(අ) 2025 ජනවාරි 24 දින ගබඩාව භෞතිකව පරීක්ෂා කිරීමේදී රු.69,938 ක් වටිනා අයිතම් 03ක භාණ්ඩ ඒකක 389 ක ඌණතාවයක්ද රු.3,800 ක් වටිනා අයිතම් 03 ක භාණ්ඩ ඒකක 08 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පිටු අංකය | විස්තරය | පොත් ශේෂය | තත්‍ය ශේෂය | ඒකක මිල | ඌණතාවය ඒකක | ඌණතාවය වටිනාකම | අතිරික්තය ඒකක | අතිරික්තය වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | | රු. | | රු. |
| 05 | සබන් | 32 | 2 | 125 | 30 | 3,750 | - | - |
| 33 | රබර් අත් වැසුම් | 356 | - | 175 | 356 | 62,300 | - | - |
| 45 | ෆීනෝල් | 19 | 16 | 1296 | 3 | 3,888 | - | - |
| 50 | කොහු | 56 | 60 | 385 | - | - | 4 | 1,540 |
| 59 | බෝල කොහු | 42 | 49 | 1,000 | - | - | 1 | 1,000 |
| 55 | නයිලෝන් කාණු බ්‍රෂ් | 22 | 25 | 420 | = | = | 2 | 1,260 |
| | | | | | 389 | 69,938 | 8 | 3,800 |



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

(ආ) 2025 ජනවාරි 24 දිනට සෞඛ්‍ය උපකරණ තොග ලේඛනය අනුව කිසිදු ශේෂයක් දක්වා නොතිබුණද, භෞතික පරීක්ෂාවේදී කොම්පෝස්ට් බඳුන් 12 ක තොගයක් පවතින බව නිරීක්ෂණය විය.

03. ජල උපකරණ තොග ලේඛනය

---

(අ) 2025 ජනවාරි 24 දින සිදු කළ ගබඩාව භෞතිකව පරීක්ෂාවේදී රු.4,100.25 ක් වටිනා එක් අයිතමයක එක් භාණ්ඩයක ඌණතාවයක්ද, රු.464 ක් වටිනා අයිතම් 02 ක භාණ්ඩ 06 අතිරික්තයක්ද, නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පිටු අංකය | විස්තරය | පොත් ශේෂය | තත්‍ය ශේෂය | ඒකක මිල | ඌණතාවය ඒකක | ඌණතාවය වටිනාකම | අතිරික්තය ඒකක | අතිරික්තය වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | | රු. | | රු. |
| 28 | ¾ වැල් සොකට් | 71 | 75 | 15 | - | - | 4 | 60 |
| 52 | ජල මීටර් | 28 | 27 | 4,100.25 | 1 | 4,100.25 | - | - |
| 62 | 90 රබර් රින්ග් | 10 | 12 | 202 | - | - | 2 | 404 |
| | | | | | 1 | 4,100.25 | 6 | 464 |

(ආ) ජල අංශයේ ගබඩා ලේඛනයට අනුව දීර්ඝ කාලයක සිට නිකුත් නොවන රු.26,724 ක් වටිනා අයිතම් 08 ක ඒකක 465 ක් පවතින බව නිරීක්ෂණය විය.

| පිටු අංකය | විස්තරය | අවසන් වරට නිකුත් කළ දිනය | ඒකක මිල | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| 01 | ½ x 1 ½ ටී සොකට් | 2014.12.28 | 20 | 07 | 140 |
| 06 | ½ පිත්තල ජේරුල් | 2019.04.09 | 800 | 13 | 10,400 |
| 25 | ¾ පිත්තල ජේරුල් | 2013.01.31 (ඉ.ගෙ.ශේ) | 195 | 21 | 4,095 |



CamScanner

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | ¾ ගේට් වැල් | 2017.02.22 | 150 | 11 | 1,650 |
| 27 | ¾ එල්බෝ | 2014.12.28 | 30 | 115 | 3,450 |
| 28 | ¾ වැල් සොකට් | 2017.02.22 | 15 | 71 | 1,065 |
| 29 | ¾ පොෂස් සොකට් | 2017.08.31 | 25 | 144 | 3,600 |
| 30 | ¾ බෙන්ඩ් | 2021.04.04 | 28 | 83 | 2,324 |
| | | | | 465 | 26,724 |

04. විදුලි භාණ්ඩ තොග ලේඛනය

---

2025 ජනවාරි 24 දින සිදුකල ගබඩා භෞතික පරීක්ෂාවේදී රු.24,850 ක් වටිනා අයිතම 03 ක භාණ්ඩ ඒකක 56 ක ඌණතාවයක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | විස්තරය | තොග පිටු අංකය | පොතට අනුව ශේෂය | සත්‍ය ශේෂය | ඒකක මිල රු. | ඌණතාවය ඒකක | ඌණතාවය වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| (i) | 125 මර්කරි චෝක් | 17 | 47 | 46 | 630 | 01 | 630 |
| (ii) | තම්බලර් ස්විච් | 184 | 116 | 75 | 420 | 41 | 17,220 |
| (iii) | Line Tap | 147 | 72 | 58 | 500 | 14 | 7,000 |
| | | | | | | 56 | 24,850 |

1988 ප්‍රාදේශීය සභා රීති 204 වගන්තිය ප්‍රකාරව කවර හෝ අවස්ථාවකදී සොයාගනු ලබන ඌණතාවයන් පිළිබඳ සතුටුදායක ආකාරයක පැහැදිලි කිරීමක් ලබාගත නොහැකි නම් භාණ්ඩවල වටිනාකම අදාල නිලධාරියා වෙතින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

05. තැන්පතු

---

මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 02 ක් ඉක්මවූ රු.863,873.77 ක් වටිනා තැන්පත් 62 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකර පොදු තැන්පත් වල රඳවාගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| තැන්පත් වර්ගය | තැන්පත් ගණන | වටිනාකම |
|---|---|---|
| ------------------- | ------------------- | ------------ |
| | | රු. |
| මිශ්‍ර තැන්පත් | 36 | 699,993.77 |
| ටෙන්ඩර් තැන්පත් | 26 | 163,880.00 |
| | 62 | 863,873.77 |

06. පරිසර ආරක්ෂණ බලපත්‍ර

---------------------------

2024 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත්වී ඇති නමුත් නිසි පරීක්ෂාවක් සිදුකර කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොමැති පරිසර ආරක්ෂණ බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | නම | ලිපිනය | කර්මාන්තය | කාලය |
|---|---|---|---|---|
| | ---- | --------- | -------------- | -------- |
| i. | ආනන්ද අබේවර්ධන | ඩී 98, තෝලංගමුව | වඩු මඩුව | 2021.01.13-2024.01.12 |
| ii. | පී.ගුණවර්ධන | 135/1, කරපනේ පාර, වාරියගොඩ | වඩුමඩුව හා ගෘහ භාණ්ඩ අලෙවි සැල | 2020.03.29-2023.03.28 |
| iii. | එච්.චමින්ද අමරසිංහ | අස්සැල්ල, නෙළුන්දෙණිය | වඩු මඩුව | 2020.07.28-2023.07.28 |
| iv. | එච්.ඒ.සුභාෂ් හෙට්ටිආරච්චි | නුවර පාර, නෙළුන්දෙණිය | වඩු මඩුව | 2020.11.10-2023.11.09 |
| v. | ඩබ්.ඩී.දයානන්ද | කන්දමුල, තෝලංගමුව | වඩු මඩුව | 2020.11.28-2023.11.27 |
| vi. | බී.ඒ.සුරංග සම්පත් | සම්පත් මොටර්ස්, තුල්හිරිය | වාහන අලුත්වැඩියා | 2020.08.11-2023.08.10 |

මේ සම්බන්ධයෙන් කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත / ක්‍රියාවලි සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(III) කෙරෙහි අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.



CamScanner

07. සුසාන භූමි

---

(අ) 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාව සතුව රු.මිලියන 21.825 ක් වටිනා සුසාන භූමි 13 ක් පවතින අතර මෙම සුසාන භූමි වලින් රු.මි.18,300 ක් වටිනා සුසාන භූමි 9 කට අදාල ඔප්පුවක් හෝ පැවරුම් නියෝගයක් ප්‍රාදේශීය සභාව සතුව නොපවතින බවට විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව නිරීක්ෂණය විය.

i. මදුරුපිටිය කරව්ව සුසාන භූමිය
ii. ගනේගම කම්මල්පිටිය වත්ත සුසාන භූමිය
iii. ඇත්නාවල සුසාන භූමිය
iv. පනානවත්ත සුසාන භූමිය
v. කුරුදාන සුසාන භූමිය
vi. පිළාඩුව සුසාන භූමිය
vii. බටුවන සුසාන භූමිය
viii. හල්ලව සුසාන භූමිය
ix. තඹදිය සුසාන භූමිය

(ආ) පොදු උපයෝගී සේවා පවත්වාගෙන යාම පිළිබඳව පළාත් පාලන ආයතනවල කාර්යයභාරය සහ වගකීම මැයින් වූ සබරගමු පළාත් පාලන කොමසාරිස්ගේ පළාත් පාලන චක්‍රලේඛ 08/2010 හි 07 ඡේදය ප්‍රකාරව සුසාන භූමි වල මායිම් ලකුණු කර මායිම් ගල් දමා එම මායිම් තාප්ප හෝ වැටවල් යොදා ආරක්ෂා කල යුතුය.එහෙත් ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කුඩුමීරිය අඬේපුස්ස සුසාන භූමියේ වැට මායිම් නොමැති බැවින් ප්‍රදේශවාසීන් විසින් ඇතැම් කොටස් අත්පත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය.

තවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව නුවර පාර, ඩඩ්ලි සේනානායක මාවතේ පිහිටි හුලංගහමුල හේන හෙවත් දම්පිටියේ සොහොන සහ දෙනිපිටියේ ඕවිට නැමති සුසාන භූමියද එකී සුසාන භූමිය බව ප්‍රදේශවාසීන්ගේ පැහැදිලි කිරීම අනුව නිරීක්ෂණයවූ අතර වපසරිය අක්කර 01 රූඩ් 03 පර්චස් 10 ක් ලෙස දක්වා තිබුණද, භෞතික පරීක්ෂාවේදී එහි ප්‍රමාණය අක්කරයකටත් අඩු බව නිරීක්ෂණය විය.

(ඇ) උක්ත චක්‍රලේඛයේ 07(v) ප්‍රකාරව සුසාන භූමි සඳහා රජයේ ඉඩම් යොදාගෙන ඇති අවස්ථාවලදී ඒවා පැවරුම් නියෝග මඟින් පළාත් පාලන ආයතන වෙත පවරා ගැනීමට

කටයුතු කළ යුතුය. පුද්ගලික ඉඩම් හිමියන්ට අයිතිය ඇති ඉඩම් පොදු සුසාන භූමි වශයෙන් පරිහරණය කරන්නේ නම් ඒවාද පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

එහෙත් 2024.12.31 දිනට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති නමුත් සභාව වෙත පවරා නොගත් අයිතිය රජය සුසාන භූමි 31 ක් පවතින බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුමෙහි 01 හි දැක්වේ.

(ඇ) අයිතිය ඔප්පුවක් මගින් සභාව සතුව පවතින පහත සඳහන් සුසාන භූමි වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

1. අළුගම මදුරුපිටික තරවාව හේන

2. තුංතොට කහගල්ල සිසිර විරාජ් අතුකෝරලට අයත් ඉඩම

මේ සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ අංක 04/2017 හා 2017 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛයේ 3.1(1) හි (ඇ) හා 3.2 කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

08. අනවසර ඉදිකිරීම්

--------------------

(අ) අනවසර ඉදිකිරීම් ලේඛනය අනුව 2024 වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තුල පහත දැක්වෙන අනවසර ඉදිකිරීම් වෙනුවෙන් නියෝග ලබාදී තිබුණත්, පසු විපරම් සිදු කල බවට ලේඛනයෙන් තොරතුරු අනාවරණය නොවුණි.

| | දිනය | අනවසර ඉදි කිරීම් සිදු කරන අයගේ නම හා ලිපිනය | අනවසර ඉදිකිරීම් පිළිබඳ විස්තරය |
|---|---|---|---|
| 1. | 2024.02.16 | ඒසියන් මෝටර්ස්, එම්.එස්.එම්.සහරාන්, නො. 117, කෙලින් වීදිය, වරකාපොල | අනවසරයෙන් ගොඩනැගිලි ඉදිකිරීම. |
| 2. | 2024.02.16 | ළහිරු ග්‍රෑම් ස්ටෝර්ස්,උසාවිය ඉදිරිපිට, තුල්හිරිය | අනවසරයෙන් ගොඩනැගිලි ඉදිකිරීම. |

| | | | |
|---|---|---|---|
| 3. | 2024.04.29 | කේ.ගුණසේකර මයා, සී 12/1, මාකුර, මල්මඩුව | මාකුර ගමමැද මාර්ගයේ අනවසර ලෙස පැති බැම්මක් ඉදි කිරීම. |
| 4. | 2020.06.03 | විදාන ගමගේ මයා, උඩවත්ත වෙළඳසැල, වරකාපොල | මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයට නියමිත දුර නොතබා අඩි 30-40 දුරින් ඉදි කිරීම සිදු කිරීම. |
| 5. | 2024.06.03 | බොම්බේ පැෂන් ආයතනය, වරකාපොල | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බෝක්කුව අවහිර කරමින් ඔය රක්ෂිතයේ ඉදි කිරීම සිදු කිරීම. |
| 6. | - | කේ.එච්.මංජුල සමන් කුමාර මයා, නාපේ, නෙළුන්දෙණිය | නාපේ බුරුන්නාව මාර්ගයේ අනවසරයෙන් මායිම් තාප්පයක් සහ ගේට්ටුවක් ඉදි කිරීම. |

(ආ) මැණික්කඩවර පිහිටි ගල්ලැල්ලවලේ හේන නැමති ඉඩම

---

2010.11.15 දින දියුණුගල්ගේ විජේසිංහ නැමති අය විසින් තෑගි ඔප්පුවක් මගින් පවරාදී තිබුණු පර්චස් 10 වපසරියකින් යුත් මැණික්කඩවර පිහිටි ගල්ලැල්ලවලේ හේන නැමති ඉඩම බෙදා නිරවුල් කිරීම සඳහා 2024 නොවැම්බර් 24 දින රු.25,000 ක මුදලක් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු වෙත ගෙවා තිබුණු අතර, 2025 ජනවාරි 24 දින භෞතිකව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

i. මැනුම් කටයුතු සිදුකර තිබුණද ස්ථිර වැටක් යොදා නොතිබුණි..

ii. ප්‍රාදේශීය සභාවේ අනුදැනුමකින් තොරව, ඉදිකර ඇති ගොඩනැගිල්ලට සම්බන්ධව තවත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අරමුණින් කුළුණු සඳහා පාදම් වලවල් කපා තිබුණි.

iii. ඉඩමේ ඉදිරිපස කොටසේ ලිඳක් ඉදිකර කොන්ක්‍රීට් පියනක් යොදා වසා තිබුණි.

09. කාර්යය මණ්ඩල පරීක්ෂාව

2024 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩල තොරතුරු අනුව තනතුරු 12 ක පුරප්පාඩු 16 ක් පැවති අතර තනතුරු 08 කට කොන්ත්‍රාත් පදනමින් 11 ක්ද තනතුරු 01 කට අනියම් පදනමින් 02 ක්ද බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| සේවා මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්යය මාණ්ඩලය | ඌණතා | කොන්ත්‍රාත් පදනම | අනියම් පදනම |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - | - | - |
| ද්විතීක මට්ටම | 01 | 01 | - | - | - |
| තෘතියික මට්ටම | 53 | 44 | 09 | - | - |
| ප්‍රාථමික මට්ටම | 71 | 64 | 07 | 11 | 02 |
| | 127 | 111 | 16 | 11 | 02 |

ඒ අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තෘතිය මට්ටමේ 09 දෙනෙකු හා ප්‍රාථමික මට්ටමේ 07 දෙනෙකු ඇතුළු නිලධාරීන් / සේවකයින් 16 දෙනෙකුගේ හිඟයක් පැවති බව නිරීක්ෂණය විය. තවද ප්‍රාථමික මට්ටමේ කොන්ත්‍රාත් පදනමින් 11 දෙනෙකුද, අනියම් පදනමින් 02 කුද දීමනා පදනමින් එක් සේවකයෙකුද වශයෙන් සේවකයින් 14 ක් සේවයේ යොදවා තිබුණි.

(ආ) ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩල 71 න් 26% ක් එනම් 19 දෙනෙකු දරන්නාට පෞද්ගලික වනසේ පත්කළ කාර්ය මණ්ඩලයක් වේ.

(ඇ) සෞඛ්‍ය කම්කරු තනතුරෙහි අනුමත සංඛ්‍යාව 11 ක් හා තත්‍ය සංඛ්‍යාව 11 ක් වුවද ඉන් පරිබාහිරව කොන්ත්‍රාත් පදනමින් 05 ක්ද, අනියම් පදනමින් 02 ක්ද, වශයෙන් සේවකයින් 18 දෙනෙකු බඳවාගෙන තිබුණි. එහෙත් අනුමත බඳවා ගැනීම් තුළ සිටින සේවකයින් 06 දෙනෙකු අදාල කාර්යයේ නොයොදවා පහත දැක්වෙන තනතුරු වල සේවයේ යොදවා තිබුණි.

(08)

| නිලධාරියාගේ නම | යොදවා ඇති තනතුර | යොදවා ඇති තනතුරට පත්කල දිනය |
|---|---|---|
| ---------------------- | ---------------------- | ------------------ |
| 1. ඩබ්.ආර්.ආර්.කේ.කුලරත්න මයා | ආදාහනාගාර ක්‍රියාකරු | 2023.08.04 |
| 2. ටී.ඒ.බී. නදීරා මිය | පෙර පාසල් පාලිකා | 2015.01.02 |
| 3. ඒ.පී. ගාමිණී මිය | විදුලි අංශයේ රාජකාරී කටයුතු | 2019.05.31 |
| 4. එන්.එච්.එල්.එස්. නානායක්කාර මයා | බර වාහන රියදුරු | 2017.01.18 |
| 5. එච්.පී.එන්.ජයවර්ධන මයා | ජල ව්‍යාපෘතියේ කම්කරු | 2022.09.28 |
| 6. එච්.පී.එන්.ජයවර්ධන මයා | ජල ව්‍යාපෘතියේ කම්කරු | 2022.09.01 |

ඒ අනුව මෙම තනතුරෙහි බඳවා ගැනීමෙහි අවශ්‍යතාවය පිළිබඳ ගැටළුවක් විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) අනුමත වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 19 ක් සඳහා තත්‍ය සංඛ්‍යාව 18 තුළ දරන්නාට පෞද්ගලික වනසේ දෙදෙනෙකු පත්කර තිබුණි. එයින් සේවකයින් 07 දෙනෙකු අනුමත තනතුරට අදාල කාර්යයන් වල නොයොදවා පහත දැක්වෙන පරිදි වෙනත් තනතුරු වල වසර 01 ත් වසර 11 ත් අතර කාල පරාසයක සේවයේ යොදවා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

| නිලධාරියාගේ නම | යොදවා ඇති තනතුර | යොදවා ඇති තනතුරට පත්කල දිනය | 2024.12.31 දිනට යොදවා ඇති තනතුරට අදාල කාලය | |
|---|---|---|---|---|
| --------------------- | --------------- | --------------- | --------------- | |
| | | | අවු. | මාස. |
| 1. එන්.ටී.එම්.ඒ. ජයරත්න මයා | ආදාහනාගාර සහායක | 2023.08.04 | 01 | 05 |
| 2. එස්.ඒ.එස්. නිරංජනී මිය | පෙර පාසල් පාලිකා | 2014.04.01 | 10 | 09 |
| 3. ඩී.පී.එස්.දිසානායක මයා | රියදුරු | 2019.03.29 | 05 | 11 |
| 4. එස්.ඒ.එස්.දයානන්ද මයා | රියදුරු | 2017.01.30 | 07 | 11 |
| 5. ජේ.එම්.පී.සී. බණ්ඩාර මයා | රියදුරු | 2017.11.01 | 07 | 02 |



CamScanner

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. ඩබ්.ටී.එස්. යානුප්‍රිය මයා | කාර්යාල සහායක | කාර්ය | 2013.03.27 | 11 | 09 |
| 7. ඒ.එම්.ඩී.එන්.ටී. නිල්මිණී මිය | පුස්තකාල කටයුතු | සේවා | 2022.01.03 | 02 | |

(ඉ) ප්‍රාදේශීය සභාව විසින් දරන්නාට පෞද්ගලික වනසේ තනතුරු 05 කට අදාළව බඳවාගෙන සිටි සේවකයින් 05 දෙනෙකු බඳවාගත් තනතුරෙහි සේවයේ නොයොදා වෙනත් තනතුරු වල දීර්ඝ කාලයක සිට සේවයේ යොදවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| නිලධාරියාගේ නම | බඳවාගත් තනතුර | සේවයේ යොදවා ඇති තනතුර | යොදවා ඇති තනතුරට පත්කල දිනය | 2024.12.31 දිනට යොදු ඇති තනතුරෙහි වසර ගණන |
|---|---|---|---|---|
| 1. කේ.පී.එන්.ඩබ්.පතිරණ මයා | කාර්යාල කාර්ය සහයක | ආයුර්වේද සහායක කටයුතු | 2014.11.04 | 10 |
| 2. එච්.එන්.ඩී.පී. කුමාරි මිය | කාර්යාල කාර්ය සහයක | ආයුර්වේද සහායක කටයුතු | 2014.11.04 | 10 |
| 3. ඒ.එස්.යූ. කරුණාසේකර මයා | පුස්තකාල සහයක | ආදායම් පරීක්ෂක | 2018.01.17 | 07 |
| 4. එම්.ආර්.ඒ.ජයවර්ධන මයා | මුරකරු | කාර්යාල කාර්ය සහායක | 2015.01.19 | 10 |
| 5. වයි.පී.එල්.කේ. සේනාරත්න මයා. | නගරශාලා භාරකරු | කාර්යාල රාජකාරී කටයුතු | 2023.02.28 | මාස 10 |

(ඊ) පුස්තකාල සහායක තනතුරෙහි අනුමත සංඛ්‍යාව 02 ක් වුවද තත්‍ය සංඛ්‍යාව 04 ක් වූ අතර ඊට අමතරව දරන්නාට පෞද්ගලික වනසේ පුස්තකාල සහයක තනතුරට බඳවාගත් සේවකයෙකු, ආදායම් පරීක්ෂක තනතුරෙහි වසර 07 ක කාලයක් තිස්සේ සේවයේ යොදවා තිබුණි.

(උ) අනුමත කාර්යාල කාර්ය සහායක තනතුරු 03 ක් සඳහා තත්‍ය සංඛ්‍යාව 03 ක් වූ අතර ඉන් සේවකයින් දෙදෙනෙකු අදාළ කාර්යයට නොයොදා ආයුර්වේද සහායක තනතුරෙහි 2014 වර්ෂයේ සිට වසර 10 කට අධික කාලයක සිට සේවයේ යොදවා තිබූ අතර පත්කළ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරට පත්කල සේවකයෙකු කාර්යාල කාර්ය සහයක තනතුරක 2022 සිට වසර 13 ක කාලයක් තිස්සේ සේවයේ යොදවා තිබුණි.

(ඌ) නගරශාලා භාරකරු ලෙස පත්කල නිලධාරියා හට නිසි පරිදි තනතුරක් ලබාදී නොමැති බවත් මේවන විට කාර්යාල රාජකාරී කටයුතු වල සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය වූ අතර අනුමත තනතුරක්වූ මුරකරු තනතුරට බඳවාගත් සේවකයා කාර්යාල කාර්ය සහයක තනතුරෙහි සේවයේ යොදවා තිබුණි.

ප්‍රාදේශීය සභාවේ අනුමත තනතුරු වලට අදාලව බඳවාගත් නිලධාරීන් වසර ගණනාවක සිට වෙනත් තනතුරු වල සේවයේ යොදවාගෙන ඇති බව උක්ත කරුණු අනුව නිරීක්ෂණය වේ.

10. කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු

-----------------------------------------

සබරගමු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CS 01/01 හා 2024 ජූලි 23 දිනැති රාජ්‍ය සේවයෙහි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ලිපි ප්‍රකාරව වර්ථමාන සේවා ස්ථානයේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථාන මාරු අයදුම් කිරීම අනිවාර්ය බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන නිලධාරීන් දෙදෙනෙකු වාර්ෂික ස්ථාන මාරු නොසලකා වසර 11 ක කාලයක් එකම ආයතනයක රැඳී සිටින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | නිලධාරියාගේ නම | තනතුර | ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කල දිනය | 2024.12.31 දිනට සේවා කාලය (වසර) |
|---|---|---|---|---|
| 01. | එන්.පී.සී. පොඩිමැණිකේ මිය | කළමනාකරණ සේවා නිලධාරී | 2013.07.03 | 11 |
| 02. | එස්.එම්.ඒ.සී.සේනානායක මිය | කාර්මික නිලධාරී | 2013.08.01 | 11 |

11. කැටගොඩෙ වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය පරීක්ෂාව

කැටගොඩෙ වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය 2025 ජනවාරි 24 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් කසල එකතු කිරීමේදී ඒවා වර්ග කර ලබා ගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය නොකරන බැවින් එකතු කරන ලද කසල, අංගනය තුළදී නැවත වෙන්කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා සේවක සහය ලබා ගැනීමේදී ඔවුන් වෙනුවෙන් දරන පාරිශ්‍රමික ඒ සඳහා ගතවන කාලයත් අනාර්ථික වැය බරක් වී තිබුණි.

(ආ) එකතු කරන කසල දින ගණනාවක් තුළ කසළ අංගනයේ රඳවා තිබීමත් කසල අංගනයෙන් බැහැර වන අපජලය ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් හෝ කානු පද්ධතියක් නොමැති වීම නිසා අංගනයට ඇතුළත් වන පිවිසුම් මාර්ගය දිගේ එම අපජලය ගලා යාමට ඉඩහැර තිබුණි. එය අංගනයේ පවිත්‍රතාවයට හා දර්ශනයට හානියක් වී තිබුණු අතර එම අපජලය අවට නිවෙස් හා ඉඩම් හරහා ගලායාම නිසා අසල්වාසීන්ට පීඩාවක් වී තිබුණි.

(ඇ) කුණු කසල මෙසේ දින ගණනාවක් වෙන් කිරීමකින් තොරව ගොඩගසා තිබීම නිසා දින කිහිපයකට පසු ඒවා වෙන්කිරීම අති දුෂ්කර කාර්යයක් වන බැවින් ඒවා වෙන්කිරීම නිසිපරිදි සිදු නොවීම හේතුවෙන් කුණු කසළ වෙන්කිරීමක් සභාව අපේක්ෂිත ප්‍රතිඵලයට ළඟා නොවීම.

(ඈ) ප්‍රාදේශීය සභා අයවැය ලේඛනයේ වැඩසටහන් අංක 02 හි සඳහන් පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය සේවා විධිමත් කිරීමත් සෞඛ්‍ය සම්පන්න නාගරික ජනතාවක්

බිහි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන බවත් මෙම ව්‍යාපෘතිය යටතේ රෝග වැළැක්වීමෙහිලා නගරය තුළ ක්‍රියාත්මක කළ හැකි සියළු පියවර ගනු ලබන බවත් රෝග බෝවීමට හේතුකාරක වනදේ ඉවත් කිරීම ප්‍රධාන කාර්ය ලෙස දක්වා තිබුණද ඉහත පරිදි ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය නිසා (ප්‍රදේශයේ ජනතාව හා ඔවුන්ගේ සෞඛ්‍යයට) ඒකී අරමුණු ව්‍යාර්ථ වී තිබුණි.

12. බැංකු ගිණුම

---

ප්‍රාදේශීය සභාව සතු ජංගම ගිණුම් 02 ක 2024 දෙසැම්බර් 31 දිනට පහත පරිදි ශේෂයන් තිබුණි.

| බැංකුව | ගිණුම් වර්ගය | ගිණුම් අංකය | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| | | | රු. |
| ලංකා බැංකුව | සේවක ණය ගිණුම | 5245539 | 2,688,374 |
| මහජන බැංකුව | පොදු ගිණුම | 54-1-001-1-7380404 | 40,957,624 |

සභාවේ මාසික සාමාන්‍ය වියදම රු.5,000,000 ක් පමණ වුවත් පරිපාලන කටයුතු වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ජංගම ගිණුමේ රු.40,957,624 ක ශේෂයක් රඳවා ගැනීම සභාවට අවාසි සහගත බැවින් ආදායමක් ලැබෙන ලෙස එනම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 131 වගන්තිය ප්‍රකාරව ආයෝජනය කර ආදායම් උපයා ගැනීමේ අවස්ථාව සභාවට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

13. වීථි පහන් නඩත්තුව

---

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග 256 ක වීථි ලාම්පු 4560 ක් ස්ථාපිත කර තිබූ අතර, 2025 ජනවාරි 24 විගණන දිනය වන විට, එයින් 1010 ක් අක්‍රිය වී තිබුණි. මෙ අනුව වීථි පහන් නඩත්තුව මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය වේ.

## 14. ආදායම් පරීක්ෂාව

### (අ) වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද වරිපනම් ආදායම රු.8,785,766 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අය කරගෙන තිබූ වරිපනම් ආදායම රු.5,771,967 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට පමණක් හිඟය රු.3,013,799 විය. මේ අනුව මුළු ඇස්තමේන්තු කරන ලද වරිපනම් වලින් සියයට 34 ක් අයකර ගෙන නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනවන විට මුළු වරිපනම් හිඟය රු.7,898,283 ක් විය. එකී මුදල අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් 1987 අංක ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

### (ආ) ඇවිදින මං තීරුව සහ ළමා උද්‍යාන ආදායම

සමාලෝචිත වර්ෂයේ ඇවිදින මංතීරුව හා ළමා උද්‍යාන ආදායම රු.1,162,000 ක් ඇස්තමේන්තු ගතකර තිබුණද විගණිත දිනය වනවිට අයකරගෙන තිබුණේ රු.576,070 ක් පමණි. මේ අනුව වර්ෂයට අදාළව අයකර නොගත් හිඟ ආදායම රු.585,930 කි. මෙය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 50 කටත් අධික වටිනාකමකි.

### (ඇ) දැන්වීම් පුවරු හා කසල බදු

දැන්වීම් පුවරු හා ඩිජිටල් දැන්වීම් සවිකිරීමේදී ප්‍රාදේශීය සභාවේ අදාළ ගාස්තු ගෙවා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව සවිකිරීම් සිදුකල යුතු වුවත් මෙම සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු ගාස්තු රු.65,487 ක් හා ඩිජිටල් දැන්වීම් පුවරු ගාස්තු රු.546,000 ක් අයකර ගැනීමට තිබුණි. එය 2024 වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද ආදායමින් සියයට 91 ක් වේ. තවද කසල බදු සඳහා රු.399,000 ක් හිඟව පැවතුණි.

(05)

15. තත්කාර්ය අත්තිකාරම් පියවීම

(අ) අංක 01/2020 හා 2020 අගෝස්තු 20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයට සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (අ) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය නිමකළ විගසම එය පියවිය යුතු වුවත් 24-5220 දරන බැකෝ ලෝඩරයේ ඉදිරිපස වීදුරුව සවිකිරීම හේතුවෙන් 2024 ජූලි 10 දින රු. 60,000/- ක අත්තිකාරමක් ලබා දී තිබුණත් එය පියවීම දින 35 ක ප්‍රමාදයකින් පසුව 2024 අගෝස්තු 30 දින සිදුකොට තිබුණි.

(ආ) අත්තිකාරම් ලබාගෙන පියවීම සිදුකිරීමේදී වරකාපොල ප්‍රාදේශය සභාවේ නිලධාරීන් මුදලින් රු.70,250 ක් අවස්ථා 05 කදී පියවා ඇති අතර, එනම් අවශ්‍යතාවය අනුව අත්තිකාරම් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත සියයට 46 සිට 95 දක්වා මුදල් අත රඳවාගෙන වැඩකරන දින 04 සිට 13 දක්වා කාල ප්‍රමාදයකින් අත්තිකාරම් පියවූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් නොපියවා දිගු කාලයක් අත රඳවා ගැනීම මගින් මුදල් අවභාවිතා වීම සිදුවිය හැකි බව විගණනයට තවදුරටත් නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 02 හි දැක්වේ.

16. මායින්නොළුව පෙරමුසු (Premix) අංගනය පරීක්ෂාව

- 2025 ජනවාරි 24 දින මායින්නොළුව පෙරමුසු අංගනය භෞතික පරීක්ෂාවේදී හා 2023 සැප්තැම්බර් 26 දිනැති SGLG/KG/A/WPS/2023/AQ/1(III) අංක දරන විගණන විමසුමෙහි 04 වන ඡේදයෙහි දැක්වෙන කරුණු නැවත විගණනය විසින් නිරීක්ෂණය කළ අතර එහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන කොලාස් සහ බිටුමින් නිකුත් කිරීම් ලේඛනයේ අවසන් වරට තොග නිකුත් කිරීම් පිළිබඳ දිනයන් සඳහන් නොවූ අතර පෙරමුසු අංගනය සතුව තොග ලැබීම් හා නිකුත් කිරීමට අදාළව සටහන් පවත්වාගෙන යාම මේ වන විටත් සිදු නොවන අතර ඒ සඳහා තොග ලේඛනයක්ද නොතිබුණි.



CamScanner

(ආ) 2021 වර්ෂයේ සිට මෙම පෙරමුසු අංගනය තාවකාලිකව වැඩ නතර කර ඇති බවට විගණනය විසින් හඳුනාගෙන පැවැති අතර, 2025 ජනවාරි 24 දිනවන විට ලීටර් 200 තාර බැරල් 21 ක් හිස්වද, භාග බැරල් 01 ක්ද, සම්පූර්ණ බැරල් 39 ක්ද වශයෙන් ලීටර් 200 තාර බැරල් 62 ක් අංගනයේ තිබුණි. මේ අනුව රු.616,200 ක් (රු.15,600 x 39.5) තාර තොගයක් නිශ්ක්‍රියව වසර 03 ක් තිස්සේ වැඩ භූමියේ ගොඩගසා තිබුණි.

(ඇ) වැඩ භූමියේ සිදුකල භෞතික පරීක්ෂාව අනුව හා නිලධාරීන් පැවසූ පරිදි මේ වන විට මෙම අංගනය භාවිතා කරන මට්ටමින් තාර මිශ්‍රකොට නිකුත් කිරීම සිදුකර ඇති බවට නිරීක්ෂණය වුවද එය සනාථ කර ගැනීමට විගණනයට ලිඛිත සාක්ෂියක් පෙරමුසු අංගනය තුළින් ලබාගත නොහැකි විය.

(ඈ) මෙම ස්ථානයේ ගබඩා කර ඇති කොලාස් හා බිටුමින් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි මට්ටමක 2025 ජනවාරි 24 දිනවන විටද පැවති අතර මෙම ද්‍රව්‍යයන් වෙන් කිරීමක් නොකොට එකට ගබඩාකොට පවතින බවත්, හිස් බැරල් 18 ක් අංගනයෙන් පිටත ගොඩගසා පැවතුණි. තවද ඒවා අව්වට හා වැස්සට නිරාවරණය වී පවතින බවත් ගතහැකි ආර්ථික වාසි මේ තුලින් නොගෙන ඇති බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) ගබඩාකොට පැවැති ඇතැම් බැරල් පලුදු වී කෝලාස් හා බිටුමින් පිටතට ගලා ඒවා සණවී පවතින බව නිරීක්ෂණය වූ අතර ඇතැම් බැරල් කපා විවෘත කර පැවතියද ඒවා නැවත වසා දැමීමක් හෝ නැවත ප්‍රයෝජනයට ගතහැකි පරිදි ගබඩා කිරීමක් සිදුකොට නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) මීට පෙර විගණන විමසුමෙන් පෙන්වා දී තිබූ පෙරමුසු අංගනයට යාබද භූමියේ වර්ෂ 03 කට පමණ පෙර රු. 6,750 කට මිලට ගෙන පැවැති අඟල් ¾ චිප්ස් ගල් කියුබ් 01 න් කියුබ් බාගයක් පමණ 2025 ජනවාරි 24 දිනවන විටත් පෙරමුසු අංගනයේ පැත්තක ගොඩගසා පැවැති බවත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

17. නිශ්ක්‍රීය වත්කම්

------------------

මායින්තොළුව මහජන පුස්තකාලය ඉදිරිපිට කොරිඩෝවේ දිරාපත් වෙමින් පවතින භාවිතා කළ හැකි හා නොහැකි යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීම සම්බන්ධයෙන් 2025 ජනවාරි 24 දිනවන තෙක් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 කෙරෙහි අවධානය යොමු කර වීමට කැමැත්තෙමි.



CamScanner

| වත්කමේ නම | නිෂ්කාර්ය වර්ෂ ගණන | භාවිතා කල හැකිද / නොහැකිද යන්න |
| --- | --- | --- |
| RA-4129 ට්‍රැක්ටරය | වර්ෂ 11 කට වැඩි | භාවිතා කල නොහැකිය |
| KUBOTA ගල්රෝල | වර්ෂ 05 කට වැඩි | භාවිතා කල නොහැකිය |
| ජෙනරේටරය | වර්ෂ 02 කට වැඩි | භාවිතා කල නොහැකිය |
| පැරණි කසල කරත්ත - 02 | වර්ෂ 06 කට වැඩි | භාවිතා කල හැකිය |
| යකඩ (BOXBAR) – 06 (පළල අඩි 1.5 හා දිග අඩි 08 ක් පමණ) | වර්ෂ 06 කට වැඩි | භාවිතා කල නොහැකිය |

18. ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරිම

මුදල් රෙගුලාසි 1645 (ආ) සහ (ඇ) ප්‍රකාරව ක්‍රමවත් හා විධිමත් ලෙස එක් එක් වාහනේ රියදුරු ලබාදෙන දෛනික ධාවන සටහන ලබා ගැනීමට සලස්වා විෂයභාර නිලධාරීන් විසින් ඒවා නිතිපතා පරික්ෂා කිරීමට වගබලා ගතයුතු අතර අදාළ මාසයට පසු මාසයේ 15 වන දිනට ප්‍රථම එම දෛනික ධාවන සටහන හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විගණිත දිනය වූ 2025 ජනවාරි 24 දින වන විටත් වාහන හා යන්ත්‍ර 27 කට අදාලව ධාවන සටහන් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

| | වාහන අංකය | ධාවන සටහන් අදාල වර්ෂය | ධාවන සටහන් වල අදාල මාසය | විගණනය වෙත ඉදිරිපත් කල දිනය | කාල ප්‍රමාදය (මාස) |
| --- | --- | --- | --- | --- | --- |
| 01. | LL-7740 | 2021 | නොවැම්බර් | 2024.06.11 | 31 |
| | | | දෙසැම්බර් | | 30 |
| | | 2023 | අප්‍රේල් සිට නොවැම්බර් දක්වා | 2024.06.11 | 14 සිට 07 දක්වා |
| | | 2023 | දෙසැම්බර් | 2024.07.10 | 07 |
| | | 2024 | ජනවාරි සිට මාර්තු දක්වා | 2024.07.10 | 06 සිට 04 දක්වා |



CamScanner

| | | | | | |
|---|---|---|---|---|---|
| 02. | බොබ්කැට් යන්ත්‍රය | 2023 | අගෝස්තු<br>සැප්තැම්බර්<br>ඔක්තෝබර්<br>නොවැම්බර් | 2024.06.11 | 10 සිට 07 දක්වා |
| 03 | RE-2270 | 2022 | ජනවාරි සිට මැයි දක්වා | 2024.06.11 | 29 සිට 24 දක්වා |
| | | 2022 | දෙසැම්බර් | 2024.08.10 | 20 |
| | | 2024 | ජනවාරි, පෙබරවාරි | 2024.08.10 | 08 |
| | | 2023 | ජනවාරි සිට දෙසැම්බර් | 2024.08.10 | 19 සිට 08 දක්වා |
| 04. | 251-1929 | 2022 | සැප්තැම්බර්, ඔක්තෝබර් | 2024.07.10 | 22, 21 |
| 05. | ZA-5220 | 2022 | ජනවාරි සිට ජූනි දක්වා | 2024.07.10 | 30 සිට 25 දක්වා |
| | | 2023 | මැයි, ජූනි | 2024.08.10 | 15,14 |
| 06. | RD-8024 | 2023 | අගෝස්තු සිට නොවැම්බර් දක්වා | 2024.07.10 | 11 සිට 08 දක්වා |
| | | 2021 | ජූලි සිට දෙසැම්බර් දක්වා | 2024.07.10 | 36 සිට 31 දක්වා |
| | | 2022 | ජනවාරි සිට මැයි දක්වා | 2024.07.10 | 30 සිට 26 දක්වා |
| 07. | RB-6287 | 2023 | නොවැම්බර්<br>දෙසැම්බර් | 2024.08.10 | 09<br>08 |
| | | 2024 | ජනවාරි සිට මාර්තු දක්වා | 2024.08.10 | 07 සිට 06 දක්වා |
| 08. | RC-6947 | 2024 | ජනවාරි සිට ජූනි දක්වා | 2024.07.10 | 06 සිට 02 දක්වා |
| | | 2023 | ජූලි සිට දෙසැම්බර් දක්වා | 2024.07.10 | 12 සිට 07 දක්වා |



CamScanner

(03)

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2022 | ජූලි සිට සැප්තැම්බර් දක්වා | 2024.07.10 | 24 සිට 22 දක්වා |
| 09. | 47-7589 | 2021 | ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා | 2024.04.10 | 30 සිට 28 දක්වා |
| 10. | XZ-1529 | 2021 | අප්‍රේල් සිට නොවැම්බර් දක්වා | 2024.07.10 | 39 සිට 32 දක්වා |
| | | 2023 | පෙබරවාරි සිට අප්‍රේල් දක්වා | 2024.07.10 | 17 සිට 15 දක්වා |

ඒ අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු වාහන 27 න් වාහන 04 ක් සඳහා 2024 වර්ෂයට ඉදිරිපත් කරන ලද ධාවන සටහන් පරීක්ෂාවේදී පහත මාසයන්ට අදාලව ධාවන සටහන් විගණිත දිනවූ 2025 ජනවාරි 24 දක්වා ඉදිරිපත්කර නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

| | වාහන අංකය | 2024 වර්ෂයට ධාවන සටහන් ඉදිරිපත් නොකල මාසය |
|---|---|---|
| 01. | LL-7740 | මැයි සිට දෙසැම්බර් දක්වා |
| 02. | RE-2270 | මාර්තු සිට දෙසැම්බර් දක්වා |
| 03. | RB-6287 | අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා |
| 04. | RC-6947 | ජූලි සිට දෙසැම්බර් දක්වා |

(ආ) පහත දැක්වෙන වාහන 23 සඳහා 2024 වර්ෂය වෙනුවෙන් 2025 ජනවාරි 24 විගණන දිනය වනතෙක් ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| ධාවන සටහන් ඉදිරිපත් නොකල වාහන අංක හා වර්ගය | |
|---|---|
| 251-1929 | QH-2862 |
| PF-7364 | XZ-1529 |
| 47-7589 | RX-0647 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| LL-7091 | RW-2079 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| 49-8736 | 67-0127 - ට්‍රැක්ටර් ට්‍රේලර් |

| | |
|---|---|
| RC-1528 | RV-2780 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| RD-8024 | RX-2009 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| RD-9422 | RX-4391 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| ZA-2382 –JCB | RX-9291 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| ZA-5220 | ZB-0330 - ට්‍රැක්ටර් ට්‍රේලර් |
| YT-9902 | |

ඉහත සඳහන් කරුණු පිළිබඳව ඔබගේ අදහස් විමසුමේ දින සිට සති 02 ක කාලයක් තුළ ලබා කටයුතු කරන්නේ නම් කෘතඥ වෙමි.

<u>පිළිතුරු එවිය යුතු ලිපිනය</u>

විගණන අධිකාරී,

විගණන උප කාර්යාලය,

කලාප අධ්‍යාපන කාර්යාලය,කෑගල්ල.

එස්.එම්.එස්.කේ. සමරකෝන් එස්. එම්. එස්. කේ. සමරකෝන්
විගණන අධිකාරී
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

විගණන අධිකාරී,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති වෙනුවට

පිටපත :- 1.පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව, රත්නපුර.

2. පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

(62)

ඇමුණුම 01

වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති නමුත් සභාව වෙත පවරා නොගත් සුසාන භූමි

1. ගන්නාව සුසාන භූමිය
2. වෙහිවැල්ලකඩුව සුසාන භූමිය
3. පල්ලේගම සුසාන භූමිය
4. මැටියගනේ සුසාන භූමිය
5. වද්දෙනිය සුසාන භූමිය
6. වැදිකන්ද සුසාන භූමිය
7. කෝද්‍රාපාලුව සුසාන භූමිය
8. හම්බෙලි කන්ද සුසාන භූමිය
9. හුණුවල සුසාන භූමිය
10. කඹැවිල සුසාන භූමිය
11. යග්ගේපිටිය සුසාන භූමිය
12. පල්ලේපැල්පිට සුසාන භූමිය
13. කිවුල්දෙණිය ලෝල්ගොඩ සුසාන භූමිය
14. ශාන්තිපුර සුසාන භූමිය
15. බටේ කොළණිය සුසාන භූමිය
16. බෝදාවල සුසාන භූමිය
17. ලෙනගල සුසාන භූමිය
18. පනානවත්ත සුසාන භූමිය
19. මනරන්ගම සුසාන භූමිය
20. අඹේපුස්ස සුසාන භූමිය
21. තුල්හිරිය මොන් රෝවියා වත්ත සුසාන භූමිය
22. තෙලිඇල්ල සුසාන භූමිය
23. ගොඩවෙල සුසාන භූමිය
24. පුහුලේගම සුසාන භූමිය
25. තෝලංගමුව සුසාන භූමිය
26. දැදිගම කන්ද සුසාන භූමිය
27. තල්ගම සුසාන භූමිය
28. මාකුර සුසාන භූමිය
29. ඉහළවෙල සුසාන භූමිය
30. ජබ්බිඩිගල සුසාන භූමිය
31. මංගෙදර දංගල කන්ද සුසාන භූමිය
32. බෝපිටිය සුසාන භූමිය
33. රඹබිඩිගල සුසාන භූමිය
34. අරුප්පල සුසාන භූමිය
35. කෝන්ගොඩ සුසාන භූමිය
36. හපුගොඩ සුසාන භූමිය
37. නෝත්ලන්ඩ් වත්ත සුසාන භූමිය
38. මෙනේරිපිටිය සුසාන භූමිය
39. හාල්මැස්ස සුසාන භූමිය
40. මැණික්කඩවර සුසාන භූමිය
41. අඹගලකන්ද ගණිතපුර සුසාන භූමිය
42. අල්පිටිය කිතුල් මූලහේන සුසාන භූමිය
43. දූම්මලදෙණිය සුසාන භූමිය
44. මංගෙදර සුසාන භූමිය
45. අලව්වත්ත සුසාන භූමිය
46. මාහේන සුසාන භූමිය
47. පරාක්‍රමගම සුසාන භූමිය
48. තුල්හිරිය සුසාන භූමිය
49. පස්පොලකන්ද සුසාන භූමිය
50. පැණිහෙල සුසාන භූමිය

ඇමුණුම [illegible]

| | විස්තරය | අත්තිකාරම් දුන් දිනය | අත්තිකාරම් මුදල | අත්තිකාරම පියවීම මුදලින් | අත්තිකාරම පියවීම බිල්පත් මඟින් | පියවූ දිනය | ප්‍රමාදය දින (වැඩ කරන) | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | | | | | |
| 01. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ RD/9422, LL-7740 හා PW-2079 හා RC-7528 රථ සඳහා රක්ෂණාවරණ ලබා ලබාගැනීම | 2024.05.08 | 20,000 | 6,310 | 13,690 | 2024 05/29 | 13 | 46 |
| 02. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2024.03.28 දින පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් සඳහා අත්තිකාරම් ලබාදීම | 2024.05.27 | 93,600 | 46,450 | 47,150 | 2024 06/03 | 04 | 49 |
| 03. | 24-5220 බැකෝ ලෝඩරයේ ඉදිරිපස වීදුරුව සවිකිරීම හේතුවෙන් ගෙවීම | 2024.07.10 | 60,000 | - | 60,000 | 2024 08/30 | 35 | - |

ඇමුණුම (1

| | විස්තරය | අත්තිකාරම් දුන් දිනය | අත්තිකාරම් මුදල රු. | අත්තිකාරම පියවීම මුදලින් | අත්තිකාරම පියවීම බිල්පත් මඟින් | පියවූ දිනය | ප්‍රමාදය දින (වැඩ කරන) | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ RD/9422, LL-7740 හා PW-2079 හා RC-7528 රථ සඳහා රක්ෂණාවරණ ලබා ලබාගැනීම | 2024.05.08 | 20,000 | 6,310 | 13,690 | 2024 05/29 | 13 | 46 |
| 02. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2024.03.28 දින පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් සඳහා අත්තිකාරම් ලබාදීම | 2024.05.27 | 93,600 | 46,450 | 47,150 | 2024 06/03 | 04 | 49 |
| 03. | 24-5220 බැකෝ ලෝඩරයේ ඉදිරිපස වීදුරුව සවිකිරීම හේතුවෙන් ගෙවීම | 2024.07.10 | 60,000 | - | 60,000 | 2024 08/30 | 35 | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 04. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ RX-2009, RD-2004, RE-2270 හා RX-4391 රථ සඳහා ආදායම් බලපත්‍ර ලාබා ගැනීම | 2024.11.07 | 5,000 | 4,750 | 250 | 2024 11/26 | 12 | 95 |
| 05. | වරකාපොල ප්‍රාදේශීය සභාවේ PF-7364 හා RV-2780 රථ සඳහා ආදායම් බලපත්‍ර ලාබා ගැනීම | 2024.12.02 | 15,000 | 9,190 | 5,810 | 2024 12/13 | 09 | 61 |
| 06. | වරකාපොල ප්‍රාදේශීය සභාව 2025 වර්ෂයට සකස් කිරීමට නියමිත අයවැය සඳහා වර්ණ A4 මිළට ගැනීම | 2024.12.23 | 10,000 | 3,550 | 6,450 | 2024 12.31 | 05 | 36 |
| | | | 203,600 | 70,250 | 133,350 | | | |